**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන- 01 ව්‍යාපෘතිය (ණය අංක 2947 එස්ආර්අයි හා 2948 එස්ආර්අයි (එස්එෆ්)) - 2015**

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ - 01 ව්‍යාපෘතිය 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2013 ජුනි 28 දින එළඹි ව්‍යාපෘති ගිවිසුමේ 2.10 වගන්තිය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2013 ජුනි 28 දින එළඹි අංක 2947 - එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය හා අංක 2948 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහන් කාලය

---

වැඩසටහනේ ණය ගිවිසුම්වලට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණු වන්නේ, නාගරික පරිසරය වැඩිදියුණු කිරීම හා මහකොළඹ ප්‍රදේශයේ නිවැසියන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමයි. වැඩසටහනෙන් අපේක්ෂා කෙරෙන්නේ (අ) ජල සම්පාදන පද්ධතිය පුනරුත්ථාපනය කිරීම හා පුළුල් කිරීම සහ කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය අඩුකිරීම (ආ) මහ කොළඹ අප ජලය සේවා වැඩිදියුණු කිරීම (ඇ) ආයතනික ව්‍යුහය හා සේවා සපයන්නන්ගේ ධාරිතාවය ශක්තිමත් කිරීම සහ කළමනාකරණය කිරීම (ඈ) ආයෝජන වැඩසටහන ක්‍රියාත්මක කිරීමයි. ණය ගිවිසුම් අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 14,784 කට සමාන එජඩෝ මිලියන 112 ක් වන අතර ඉන් රු. මිලියන 11,088 ක් හෙවත් සියයට 75 කට සමාන එජඩෝ මිලියන 84 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි රු. මිලියන 3,696 කට හෙවත් සියයට 25 කට සමාන එජඩෝ මිලියන 28 ක් සඳහා ශ්‍රී ලංකා රජය විසින් දායකත්වය ලබාදීමට අපේක්ෂිතය. වැඩසටහන එහි කටයුතු 2013 ජුනි 28 දින ආරම්භ කරන ලද අතර 2016 දෙසැම්බර් 31 දින වන විට නිම කිරිමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී.ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට

අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් වැඩසටහන විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද වැඩසටහන් වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් වැඩසටහන විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඊ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(උ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ වැඩසටහනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඌ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඔ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**---------------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 මතය**

**---------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් වැඩසටහන විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව , සහ

(ඊ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩු පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන 02 - ව්‍යාපෘතිය නැමති වෙනත් ව්‍යාපෘතියක් වෙනුවෙන් වැඩසටහන විසින් වැයකළ රු. මිලියන 2.45 ක් අනෙකුත් ව්‍යාපෘතිවලින් ලැබිය යුතු මුදල් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට කෙරීගෙන යන සිවිල් වැඩ යටතේ ගිණුම් ගත කර තිබුණි. එයට අමතරව, ඉහත සඳහන් ව්‍යාපෘතිය සඳහා අත්පත්කරගත් පාමංකඩ ඉඩම වෙනුවෙන් කළ රු.මිලියන 10 ක් වූ අත්තිකාරම් ගෙවීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදුකළ සැපයුම් අත්තිකාරම් යටතේ දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇති වෙනත් විදේශාධාර ව්‍යාපෘතිවලින් අයකරගත යුතු ශේෂ රු.මිලියන 12.45 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ආසියානු සංවර්ධන බැංකුව විසින් ණය අංක 2947 එස්ආර්අයි හා 2948 එස්ආර්අයි (එස්එෆ්) යටතේ අයකළ පොලී පිළිවෙලින් එජඩො 14,692 ක් හා එජඩො 268,340 ක් සමාලෝචිත වර්ෂය සඳහා ගිණුම්වලට ගෙන නොතිබුණි.

### 2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

මුදල් රෙගුලාසි 133 හා 2010 ජූලි අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය අනුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් වැඩසටහනේ කටයුතු විගණනයට භාජනය කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම්වල මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසංබැ | 84 | 11,088 | 1,350 | 10.31 | 1,353 | 17.49 | 2,285 |
| ශ්‍රීලංර | 28 | 3,696 | - | 6.20 | 866 | 7.38 | 1,021 |
| එකතුව | 112 | 14,784 | 1,350 | 16.51 | 2,219 | 24.87 | 3,306 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සැලසුම් කරන ලද කාල පරිච්ඡේදය ඇතුළත වෙන්කරන ලද සම්පත් යොදාගනිමින් ව්‍යාපෘතියේ අරමුණු ඉටුකරගැනීම තහවුරු වනු පිණිස සමස්ත ව්‍යාපෘති කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි මාසික, කාර්තුමය හා අර්ධ වාර්ෂික ආදී වශයෙන් මූල්‍ය හා භෞතික ඉලක්ක ඉස්මතු වන ලෙස වගකීම් දක්වමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතුය. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ආරම්භ කර වසර 02 ½ ක් ඉකුත්වීමෙන් පසුවද, ව්‍යාපෘතිය විසින් එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රජයේ දායකත්වය සඳහා 2015 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවේ කිසිදු අරමුදලක් වෙන්කර නොතිබුණද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර මගින් ලද අරමුදලින් රු.මිලියන 866 ක් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී වැය කර තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

---------------------

ව්‍යාපෘතිය විසින් ඉදිරිපත්කළ ප්‍රගති වාර්තාව අනුව, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 6.45 ක් හා සියයට 21.68 ක් වශයෙන් ඉලක්කයන්ට වඩා පසුපසින් පැවතුණි. ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කළ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් | 2015 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතියේ ප්‍රතිශතය | |
|---|---|---|
| | ඉලක්කය | තථ්‍ය |
| කොළඹ - උතුර ආදායම් නොලබන ජලය අඩුකිරීම සඳහා වූ පද්ධතිය පුනරුත්ථාපනය කිරීම | 21 | 8 |
| කොළඹ - නැගෙනහිර ආදායම් නොලබන ජලය අඩුකිරීම සඳහා වූ පද්ධතිය පුනරුත්ථාපනය කිරීම | 4 | 2 |
| පද්ධති යෙදවුම් පරිමා මීටර සැපයීම,සවිකිරීම හා ක්‍රියාත්මක කිරීම | 10 | 5 |
| ස්වයංක්‍රීය මීටර මනු කියවීමේ මීටර සැපයීම, සවිකිරීම හා ක්‍රියාත්මක කිරීම සහ තොරතුරු තාක්ෂණය සඳහා උපකරණ සැපයීම, බෙදාහැරීම හා සවිකිරීම | 15 | 12 |
| කාන්දු හඳුනාගැනීම් හා අනෙකුත් සියලු සම්බන්ධිත උපකරණ සැපයීම හා සවිකිරීම | 100 | 30 |

ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ මාලිගාකන්ද එලි හවුස් (පවර් හවුස්) කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම, ආදායම් නොලබන ජලය කළමනාකරණය හා මහජනයා දැනුවත් කිරීමේ ව්‍යාපාර ආදිය සඳහා උපදේශක වැඩ පිළිබඳ කාර්යයන් ආරම්භ කිරීමට ව්‍යාපෘතිය විසින් කටයුතු කර නොතිබුණි. 2015 අගෝස්තු 20 දිනැති දූතමණ්ඩල සමාලෝචන වාර්තාවේ කාල නිර්ණ ක්‍රියාකාරී සැලැස්ම අනුව, මහජනයා දැනුවත් කිරීමේ හා මාධ්‍ය ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘතියේ ජල භාවිතා කරන ප්‍රජාවගේ ධාරිතා වර්ධනය සඳහා උපදේශකවරු යෙදවීම 2015 ඔක්තෝබර් 30 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

රු.මිලියන 16.16 පිරිවැයකට විදේශීය සමාගමකට 2014 මැයි 29 දින පිරිනමන ලද කාන්දු අනාවරණය හා ඒ සම්බන්ධ උපකරණ සැපයීම හා සවිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව කොන්ත්‍රාත්කරු සමඟ අන්‍යෝන්‍ය එකඟතාවයකින් නවතා දමා තිබුණි. තරඟකාරී ලංසු ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව හා ගිවිසුමක් නොමැතිව ඉහත සඳහන් කළ සමාගමේ දේශීය නියෝජිත හරහා දේශීය වෙළඳපොලෙන් රු. මිලියන 10.62 ක පිරිවැයකට අදාළ උපකරණ වලින් කොටසක් ප්‍රසම්පාදනය කිරීමට ව්‍යාපෘතිය විසින් කටයුතු කර තිබුණි. තවද, උපකරණ වල වගකීම හා නඩත්තුව සඳහා ඉහත දක්වන ලද දේශීය නියෝජිත සමඟ 2015 ඔක්තෝබර් 26 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. කෙසේ වෙතත් අවබෝධතා ගිවිසුමේ අත්සන් කළ බලයලත් නිලධාරීන්ගේ තනතුරු නාමයන් දක්වා නොතිබීම සහ සමාගමේ හා වැඩසටහනේ රාජකාරී නිල මුද්‍රාව ඒ මත තබා නොතිබීමේ ප්‍රතිඵලයක් ලෙස අවබෝධතා ගිවිසුමේ නීත්‍යානුකූල බව විගණනයේදී ප්‍රශ්නගත විය.

## 3.4 මතභේදයට තුඩු දෙන කරුණු

-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැඩසටහන 2016 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණද, කොළඹ උතුර හා කොළඹ නැගෙනහිර ආදායම් නොලබන ජලය අඩුකිරීම සඳහා පද්ධතිය පුනරුත්ථාපනය කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්තු පිළිවෙලින් 2014 ඔක්තෝබර් 30 හා 2015 මාර්තු 12 දින පිරිනමා තිබුණු අතර පිළිවෙලින් 2018 ජූලි 05 හා 2019 ජූලි 13 දින නිම කිරීමට එකඟවී තිබුණි. මෙලෙස වැඩසටහන අවසන් වන දිනය සලකා බැලීමකින් තොරව වැඩසටහන යටතේ කොන්ත්‍රාත් නිම කිරීමේ දිනය තීරණය කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2014 ඔක්තෝබර් 30 දින සිට රු. 600,000 ක මාසික කුලියකට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා කුලී පදනම මත වෙනත් ගොඩනැගිල්ලක් ලබා ගැනීමෙන් පසුවද එකතුව රු.මිලියන 1.68 ක් වූ කුලී කාර්යාල ගොඩනැගිල්ලක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී අඛණ්ඩව ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) වැඩසටහන විසින් ප්‍රසම්පාදනය කළ මෝටර් වාහන 06 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ භාවිතය සඳහා මුදා හැර තිබියදී සමාලෝචිත වර්ෂය තුළදී වැඩසටහන විසින් කුලියට ගන්නා ලද මෝටර් වාහන 06 ක් සඳහා රු.මිලියන 22.29 ක් කුලී ලෙස ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. තවද, සමාලෝචිත වර්ෂය තුළදී වැඩසටහන විසින් රු.මිලියන 2.08 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කළ පරිගණක හා පරිගණක උපාංග ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ භාවිතය සඳහා මුදා හැර තිබුණි.